# වසංගත රෝග විද්‍යා අංශය

**සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය**

**231, ද සේරම් පෙදෙස, කොළඹ 10.**

දුර: (+94 11) 2695112, 4740490, 4740491, 4740492 , 2681548 ෆැක්ස්: (+94 11) 2696583 ඊ මේල්: chepid@sltnet.lk, epidunit@sltnet.lk වෙබ්: www.epid.gov.lk


## නව කොරෝනා වෛරස් ආසාදනය (2019-nCoV තීව්‍ර ශ්වසන රෝගය) දෛනික වාර්තාව 2020.02.07 පෙ.ව. 10

- හේතුවක් නිශ්චිතව හඳුනා නොගත් නියුමෝනියා වසංගත රෝග තත්වයක් මුල්වරට 2019 දෙසැම්බර් 31 වන දින චීනයේ හුබෙයි පළාතේ වුහාන් නගරයෙන් වාර්තා විය.

- 2020 ජනවාරි 07 වන දින එම වසංගත තත්වයට හේතුව නව කොරෝනා වෛරසය බව මුල්වරට හඳුනා ගන්නා ලදී.

- 2020 ජනවාරි 30 දින මෙම රෝගය 2019-nCoV තීව්‍ර ශ්වසන රෝගය ලෙස නම් කරන ලද අතර එදිනම ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් මෙම රෝගයේ ව්‍යාප්තිය සලකා ගෝලීය මහජන සෞඛ්‍ය හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරන ලදී.

- මෙම රෝගයේ බීජෞෂණ කාලය (විෂබීජය ශරීරගත වූ දින සිට රෝග ලක්ෂණ පහළ වීම දක්වා ගතවන කාලය) දින 2 - 14 දක්වා බව දැනට තිබෙන දත්ත අනුව පැහැදිලි වේ.

- මෙම රෝගය පළමුව සතුන් ගෙන් මිනිසාට බෝවන බවට හඳුනා ගත්තද, දැන් මිනිසාගෙන් මිනිසාටද බෝවිය හැකි බව තහවුරු කරගෙන ඇත.

- ශ්‍රී ලංකාවේ කොරෝනා වෛරසය ආසාදිත බවට තහවුරු කරන ලද පළමු රෝගියා 2020 ජනවාරි 27 වන දින වාර්තා විය. එම චීන ජාතික කාන්තාව 2020 ජනවාරි 19 වන දින සංචාරකයෙකු ලෙස දිවයිනට පැමිණ ඇත. ඇය දැන් සම්පූර්ණයෙන්ම සුවය ලබා සිටී. මේ මොහොත වන විටත් ශ්‍රී ලංකාවෙන් වාර්තා වන්නේ එම රෝගියා පමණි.

- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පහත දක්වෙන රෝහල් 14 තුළ මෙම රෝගයට ප්‍රතිකාර ගැනීම සඳහා විශේෂ පහසුකම් සලසා ඇත.

  ජාතික රෝහල- කොළඹ, රිජ්වේ ආර්යා ළමා රෝහල, ජාතික බෝවන රෝග විද්‍යායතනය (IDH), උතුරු කොළඹ ශික්ෂණ රෝහල-රාගම, ගම්පහ මහ රෝහල, මීගමුව මහ රෝහල, ජාතික රෝහල-මහනුවර, ශික්ෂණ රෝහල-කරාපිටිය, ශික්ෂණ රෝහල-අනුරාධපුර, ශික්ෂණ රෝහල-යාපනය, ශික්ෂණ රෝහල-කුරුණෑගල, පළාත් මහරෝහල-රත්නපුර, පළාත් මහරෝහල-බදුල්ල, ශික්ෂණ රෝහල-මඩකලපුව.

- චීනයේ සිට රටට පැමිණෙන ශ්‍රී ලාංකික සිසුන් (සහ වෙනත්

### ලෝක තත්වය

- තහවුරු කරන ලද රෝගීන් 28276 (28060 චීනයෙන් - 216 වෙනත් රටවල් වලින්)
- ආසාදිත රෝගීන් රටවල් 24 කින්
- මරණ 565 (564 චීනයෙන්- 1 පිලිපීනයෙන්)

-ලෝක සෞඛ්‍ය සංවිධානයේ දිනපතා වාර්තාව 06/02/2020







### ශ්‍රී ලංකාවේ තත්වය

- තහවුරු කරන ලද රෝගීන් 1
- දැනට රෝහල් ගත කර සිටින සැකසහිත රෝගීන් 14

| | |
|---|---|
| ජාතික බෝවන රෝග විද්‍යායතනය | 4 |
| පළාත් මහ රෝහල-බදුල්ල | 1 |
| ශික්ෂණ රෝහල-අනුරාධපුර | 1 |
| ජාතික රෝහල - මහනුවර | 4 |
| ශික්ෂණ රෝහල රාගම | 1 |
| දිස්ත්‍රික් මූලික රෝහල - මීගමුව | 3 |
| **Total** | **14** |

- මූලාශ්‍රය - වසංගත රෝග විද්‍යා අංශය
රෝග ආවේක්ෂණ පද්ධතිය

කටයුතු සඳහා චීනයට ගොස් පැමිණෙන්නන් සඳහා) රටට පැමිණි දින 14 ක් යන තෙක් ඔවුන්ගේ නිවෙස්වලටම වී සිටිය යුතුය. පිරිස් ගැවසෙන ස්ථානවලට යැමෙන් වැළකිය යුතුය. එම කාලය ඇතුළත යම්කිසි රෝග ලක්ෂණයක් (උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව) ඇතිවුයේ නම් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මහතා දැනුවත් කර ඔබට ආසන්නයේම පිහිටි ඉහත රෝහලක් වෙත ගොස් ප්‍රතිකාර ලබා ගන්න (ඒ සඳහා මෙම වෙබ් අඩවියේ ඇති විශේෂ උපදෙස් පත්‍රිකාව කියවන්න).

- දැනට මහජනතාව හෝ දරුවන් විසින් මුඛ ආවරණ පැළඳීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිර්දේශ කර නොමැත.

- චීනයේ වුහාන් නගරයේ සිටි ලාංකික සිසුන් 33 දෙනා 2020 පෙබරවාරි 01 දින මෙරටට පැමිණි අතර මේ වනවිට නිරෝධායන කටයුතු සඳහා දියතලාව යුද හමුදා රෝහල වෙත යොමු කර ඇත. මේ වන විට සියලු දෙනා සුවෙන් පසුවේ.

**රෝගය වැළැක්වීම සඳහා**

1. උණ, සෙම්ප්‍රතිශ්‍යාව රෝග වලින් පෙළෙන රෝගීන් සමග සමීප සම්බන්ධතාවයන් ගෙන් වැළකීම.
2. නිතර සබන් දමා අත් සේදීම.
3. සජීවී හෝ මළ සතුන් ඇල්ලීමෙන් වැළකීම.
4. නිතර නාසය, ඇස සහ මුඛය ඇල්ලීමෙන් වැළකීම.
5. කිඹුහුන් යනවිට සහ කහින විට පාවිච්චි කර ඉවත්කරන ටිෂු භාවිතා කිරීම හෝ වැලමිට භාවිතා කිරීම.
6. ජනතාව බහුලව ගැවසෙන ස්ථානවලට යැමෙන් හැකිතාක් වළකින්න.

**ගුවන් තොටුපලේ ඇති ආවේක්ෂණ පද්ධතිය**

- පුද්ගලයන්ගේ උෂ්ණත්වය හඳුනාගත හැකි ස්කැනර් යන්ත්‍ර ස්ථාපනය කර ඇත.
- රටට පැමිණෙන සියළු මගීන් සෞඛ්‍ය දත්ත පෝරමය අනිවාර්යයෙන් පිරවිය යුතුය.
- සෞඛ්‍ය තොරතුරු මධ්‍යස්ථානයක් පැය 24 පුරා ක්‍රියාත්මක වේ.